# මිහින්තලේ බෞද්ධ ආරාම සංකීර්ණය ආශ්‍රිත ජල සම්පාදනය සහ කළමනාකරණය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

**ඩබ්ලිව්.එම්.එච්.පී.ජේ.කේ. වීරසිංහ[1], අයි.එම්.එම්. මධුෂාන්[2]**

ප්‍රමුඛ පද: මිහින්තලය, බෞද්ධ ආරාම, පොකුණු, ජල සම්ප්‍රාදනය සහ කළමනාකරණය

## හැඳින්වීම

සිංහල බෞද්ධ සංස්කෘතියේ මූලාරම්භය සනිටුහන් වෙන මිහින්තලය අතීත සංස්කෘතියේ ජීවමාන කෞතුකාගාරයක් වශයෙන් ශේෂ ව පවතී. ක්‍රි.පූ 246 දී මිහිඳු හිමියන් ප්‍රමුඛ ධර්මදූත පිරිස වැඩම වූ ස්ථානය වශයෙන් හඳුන්වනු ලබන මිහින්තලේ පුදබිම, සෑගිරිය, අම්බස්තලය, මිස්සක පව්ව ආදී අන්වර්ථ නාමයන්ගේ හඳුන්වනු ලබයි. මෙම පුදබිම මහකනදරාවේ වම් ඉවුරේ පිහිටා ඇති අතර මුහුදු මට්ටමේ සිට මීටර් 300 පමණ උස ශේෂ කඳු කීපයක් පුරා පැතිර ඇත. එම ශේෂ කඳු අතර මිහින්තලේ කන්ද, ඇත්වෙහෙර කන්ද, රාජගිරි ලෙන කන්ද ප්‍රධාන තැනක් ගනියි. බුදු දහම ලැබීමත් සමග මෙම භූමිය තුළ විහාරාම රාශියක් ව්‍යාප්ත වී ඇති අතර ඒ බව ශේෂ කඳු මුදුන්වල මෙන්ම කඳු පාමුල විසිරී ඇති වාස්තු විද්‍යාත්මක නිර්මාණ සාක්ෂි දරයි. ඒ අනුව මෙම බෞද්ධ ගිරි ආරාමය තුළ භික්ෂූන් වහන්සේලා දෙදහස් පමණ වැඩ සිටි බව සඳහන් වේ. මෙම භික්ෂූන් වහන්සේලාට අවශ්‍ය ජල පහසුකම් වෙනුවෙන් පොකුණු රාශියක් ඉදිකර ඇති බව හඳුනාගත හැකිය. ඒ අනුව මෙම පර්යේෂණයේ පර්යේෂණ අරමුණ වනුයේ මිහින්තලේ බෞද්ධ විහාරාමය ආශ්‍රිත ජල සම්පාදනය සහ ජල කළමනාකරණය සිදුවූ අන්දම අධ්‍යයනය කිරීමයි. එමෙන්ම පර්යේෂණ ගැටලුව වෙනුයේ මෙම ක්ෂේත්‍රයේ ආශ්‍රිත භික්ෂූන් වහන්සේලාගේ අවශ්‍යතා වෙනුවෙන් නිර්මාණය කළ ජල සම්පාදන සහ ජල කළමනාකරණ ක්‍රමවේද කෙසේ සකස් වී තිබුණේ ද යන්න අධ්‍යයනය කිරීමයි.

## ක්‍රමවේදය

උක්ත පර්යේෂණය සඳහා ප්‍රධාන වශයෙන් ක්ෂේත්‍ර අධ්‍යනය සහ ක්ෂේත්‍ර නොවන අධ්‍යයන ක්‍රමවේදය යොදා ගන්නා ලදී. මෙහිදී මිහින්තලේ සම්බන්ධ ප්‍රාථමික හා ද්විතීක මූලාශ්‍ර පරිශීලනය කළහ. දත්ත විශ්ලේෂණය කිරීම සඳහා ගුණාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රමවේදය උපයෝගි කර ගැනීම සිදු කළ අතර දත්ත ඉදිරිපත් කිරීම සඳහා විශ්ලේෂණාත්මක කථන ක්‍රමවේදය සහ සැළසුම් සහ ඡායාරූප භාවිත කරනු ලැබේ.

---

[1, 2] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, මානව ශාස්ත්‍ර අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

weerasinghemalisha054@gmail.com madushamilinda9@gmail.com

ප්‍රතිඵල හා සාකච්ඡාව

ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ පිහිටා ඇති මෙම ප්‍රදේශය සඳහා වර්ෂාව ලැබුණේ වසරේ එක් කාල පරිච්ඡේදයක පමණි. මෙරට පුරාණ බෞද්ධ ආරාම ආශ්‍රිත ව ජල සම්පාදනය සහ කළමනාකරණය සඳහා වැව්, පොකුණු, ළිං හඳුනා ගත හැකි වුවත් මෙම බෞද්ධ ආරාමීය පරිශ්‍රය තුළ ප්‍රධාන වශයෙන් පොකුණු භාවිත වූ බවට නෂ්ටාවශේෂ සාක්ෂි දරයි. මෙහිදී නාග පොකුණ, තිඹිරි පොකුණ, සිංහ පොකුණ, කලුදිය පොකුණ මෙන්ම ඉදිකටු සෑය සහ රාජගිරි ලෙන ආශ්‍රිත පොකුණු හඳුනාගත හැකි ය. මේ අනුව වැසි ජලය රැස්කර තබාගැනීම සඳහා මෙම පොකුණු නිර්මාණය කර ඇත. එහිදී නාගපොකුණ නයි පෙණ පහකින් අලංකාර කර මීටර් 12ක් පමණ දිගකින් සහ මීටර් 05 ක් පළලකින් යුක්ත ව නිර්මාණය කර ඇත. වැසි සමයේ දී කඳු මුදුනේ සිට පිහිටි ගල දිගේ ගලා එන ජලය සහ දිය පාරවල් මඟින් ජලය රැස්වේ. ඒ අනුව නාග පොකුණේ සිට සිංහ පොකුණට මෙන් ම දානශාලාව සඳහා අවශ්‍ය ජලය රැගෙන යෑම සඳහා මැටි නල යොදාගෙන ඇති බව පුරාවිද්‍යාත්මක තහවුරු වී ඇත. එම මැටි නල මිහින්තලේ පුරාවිද්‍යා කෞතුකාගාරය තුළ, මිහින්තලේ ආශ්‍රිත ජල කළමනාකරණය යන තෙවැනි මැදිරිය තුළ ප්‍රදර්ශනය කර ඇත. එහිදී මැටි නල අටක් ප්‍රදර්ශනය කර ඇති අතර ඒවා එකිනෙකට සම්බන්ධ කළ හැකි විවිධ ප්‍රමාණයන්ගෙන් යුක්ත නිර්මාණයන් වේ.

මෙම බෞද්ධ ගිරි ආරාමය තුළ හඳුනා ගත හැකි සුවිශේෂී පොකුණක් වනුයේ තිඹිර පොකුණයි. මෙම පොකුණ දානශාලාව ට නැගෙනහිර පිහිටි බෑවුමේ හි පිහිටා ඇත. කඳු බෑවුමේ ඔස්සේ ගලා එන ජලය රැස්වෙන අන්දමින් පතසක් කේන්ද්‍රය කරගනිමින් නිර්මාණය කර ඇත. එම පොකුණේ ජලය ගිරිභණ්ඩ සෑ ස්තූපය අසල ආරාමවාසී භික්ෂූන් වහන්සේලාට රුකුලක් වී ඇත. මීට අමතර මිහින්තලේ බටහිර බෑවුමේ පිහිටි කළුදිය පොකුණ මෙම ගිරි ආරාම පරිශ්‍රය තුළ හඳුනාගත හැකි විශාලතම පොකුණයි. ඇත්වෙහෙර සහ ආනෙයිකුට්ටි කන්ද අතර බෑවුමේ පිහිටි පතස් භූමිය උපයෝගී කරගනිමින් නිර්මාණය කර ඇත. පිහිටි ගල සහ ශෛලමය ගල් බැමි බැඳීමෙන් නිර්මාණය කර ඇති මෙම පොකුණ එම පරිශ්‍රයේ වැඩසිටි භික්ෂූන් වහන්සේලාගේ සනීපාරක්ෂක කටයුතු බෙහෙවින් ඉවහල් වී ඇත.

මිහින්තලේ ආරාම පරිශ්‍රය තුළ පිහිටි ඉදිකටු සෑය ආසන්නයේ දක්නට ලැබෙන සමසතරැස් පොකුණ ඉතා සුවිශේෂී නිර්මාණයකි. මනා ලෙස ඔපමට්ටම් කළ ශිලා කුට්ටි උපයෝගී කරගනිමින් නිර්මිත මෙම පොකුණ පුන්කලස් සහිත පියගැට පෙළකින් ප්‍රවේශ විය හැකිය. මෙහි දී පංචාවාස පරිශ්‍රයේ සිට පොකුණ වෙත ජලය රැගෙන යෑම සඳහා ශෛලමය කාණු පද්ධතියක් නිර්මාණය කර ඇත. රාජගිරි ලෙන් ආරාම ආශ්‍රිත ව වර්ෂාවෙන් ලැබෙන ජලය ස්ථානයෙන් පිටතට රැගෙන යෑම සඳහා ගලේ කාණු සකස් කර තිබේ. එසේ කාණු පද්ධතියෙන් පිටතට රැගෙන යන ජලය ගබඩා කිරීම සඳහා ආරාමය තුළ

පොකුණක් ඉදි කර තිබෙන ආකාරය හඳුනා ගත හැකි ය. ඒ සඳහා ශිලා කොටස් භාවිත කර ගනිමින් නිර්මාණය කර ඇත.

සමාලෝචනය

මේ අනුව සමස්තයක් ලෙස ගත්කළ මෙම බෞද්ධ ආරාම පරිශය තුළ ජල සම්පාදනය සහ කළමනාකරණය සඳහා පොකුණු ප්‍රධාන වශයෙන් භාවිත කර ඇති බව තහවුරු වේ. එහි දී භාවිත ක්‍රමවේද අතර මැටි නල භාවිත කර ජලය පරිවහනය, ශිලා කාණු උපයෝගී කරගනිමින් ජලය පරිවහනය කිරීම, පිහිටි ගලෙහි කාණු සකස් කර ජලය පරිවහනය කිරීම හඳුනාගත හැකිය. එමෙන්ම මෙම ගිරි ආරාම පරිශ්‍රය තුළ ජල සම්පාදන සහ කළමනාකරණ පිළිවෙත් අතීත ජල විද්‍යාත්මක දැනුම සහ ඉංජිනේරුමය හැකියාවන් ප්‍රකට කරයි.

ආශ්‍රිත මූලාශ්‍රය

සෙනෙවිරත්න, අනුරාධ. (2001). ***සිංහල ශිෂ්ටාචාරයේ උදාගිර මිහින්තලාව.*** ගොඩගේ කොළඹ: ප්‍රකාශකයෝ.

අඹන්වල, චන්දිම. (2018). ***හෙළ බොදු හැදියාවේ බිහිදොර මිහින්තලාව.*** මහනුවර: බුවනෙක ප්‍රකාශකයෝ.